19 පිටෙන්




පදිංචිය පිණිස පැමිණි අතර, එහි දී අර්නෙස්ටෝ සිය වෛද්‍ය අධ්‍යාපනය ඇරඹීය.

**ඇල්බර්ටෝ ග්‍රෙනාඩෝස් [ALBERTO GRANADOS] මෙසේ කියයි:**

අපි හැමෝම හිතුවේ ඔහු වැඩියෙන්ම දක්ෂ වුනේ ගණිතයට නිසා, ඉංජිනේරු අංශයේ උසස් අධ්‍යාපනය තෝරා ගනීවිය කියලා. ඒ වෙනුවට ඔහු වෛද්‍ය විද්‍යාලයේ ලියා පදිංචි වුනාය කිවුවහම අපි හැමෝම පුදුම වුනා. ඉගෙන ගන්නා අතරේ අර්නෙස්ටෝ නගර සභාවට සම්බන්ධ අර්ධ කාලීන රැකියාවක් කෙරුවා. ඒ අතරේම අසාත්මිකතා පර්යේෂණ ආයතනයකත් ස්වේච්ඡා පදනමෙන් වැඩ කළා.

වයස 18 ක් පමණ වූ විට එවකට වූ ආජන්ටිනියානු නීතියට අනුකූලව අර්නෙස්ටෝ අනිවාර්ය යුද හමුදා සේවය සඳහා ලියා-පදිංචි විය. එහෙත්, පරීක්ෂණ වලින් අනතුරුව, හමුදා වෛද්‍යවරු ඇදුම රෝගය නිසා ඔහු කිසිදු අන්දමක හමුදා සේ-වයක යොදා ගැනීමට නුසුදුසු බැව් නිර්දේශ කළහ.

හැම විවේක දිනයකම අර්නෙස්ටෝ කළේ සොයා ගත හැකිව තිබූ ඕනෑම ක්‍රමයකින් සංචාරය කිරීමය. විටෙක පයින්. තවත් විටෙක කුඩා මෝටරයක් සවි කළ බයිසිකලයකින්. මෙලෙස ඔහු ආජන-'ටිනාවේ විවිධ පළාත්හී සංචාරයේ යෙදුනේය. තවත් විටෙක ඔහු වෙළඳ මුහුදු යාත්‍රාවකට බැඳී කැරිබියන් මුහුදේ සංචාරය කළ අතර එය අර්නෙස්ටෝ මවුරටෙන් බැහැර ගිය මුල්ම අවස්ථාව විය.

**චේ [CHE] මෙසේ කියයි:**

කියුබාවෙදිවත් මම ගිය වෙනත් රටකදීවත්, කිසිම තැනකදී මට මම විදේශිකයෙක් ය කියලා හැඟීමක් ඇති වුනේ නෑ. ගෝතමාලාවේදී ගෝතමාලානියානුවෙක් විදිහටත්, මෙක්සිකෝවේදී මෙක්සිකානුවෙකු විදිහටත්, පීරුවල දී පීරුවියානුවෙකු විදිහටත් දැනුනා. හරියටම මේ දැන් මම කියුබාවේ ඉන්දැද්දි කියුබානුවෙක් විදිහට දැනෙනවා වගේම. ඒත් ඒ හැම තැනකදීමත්, මට මම ආජන්ටියානුවෙක්ය කියන හැඟීමත් එහෙමම තිබුනා.

**ඇල්බර්ටෝ ග්‍රෙනාඩෝස් [ALBERTO GRANADOS] මෙසේ කියයි:**

අර්නෙස්ටෝ එයාගෙ යාලුවන්ට මෙහෙම කිවුවා.

"ඔයාලා මෙහෙ ඉඳන් විභාග තුනක් කවර් කරන්න සූදානම් වෙනවා. ඒ වෙනුවට මම සැලසුම් කරන්නෙ තාමත් රටේ යන්න බැරි වුනු පළාත් තුනක් කවර් කරන්න! ඒත් මේ සංචාර අස්සෙම ඔයාලා වගේම විභාග තුන සමත් වෙන්නත් මට ඕනෑ."

ඇත්තටම ඔහු ඒ දේ කළා. එයා සැලසුම් කරපු ප්‍රදේශත් කවර් කළා. විභාගත් කවර් කළා ඉහළින්ම. සමහර විට ඕනෑවටත් වඩා හොඳින්. අර්නෙස්ටෝ හිතුවේ තමන්ට ලැබෙන ග්‍රේඩ් එක (ශ්‍රේණිය) ගැන නෙමේ. ලැබෙන ඉහළ ලකුණු ගණන නෙමේ. ඒ වෙනුවට ඔහු තමන්ට ප්‍රයෝජනවත් දේවල් ඉගෙන ගෙන දැන ගැනීමේ අවංක උවමනාවකින් වැඩ කළා.

ලතින් ඇමරිකාවේ සංචාරය කරලා, මේ අපූරු මහද්වීපයේ සුන්දරකමත්, ඒකට යටින් හැංගිලා තිබ්බ මිනිස්සුන්ගෙ දුක්බර ජීවන රටාවත් හොයා ගෙන යාමේ හීනයක් දිග කාලයක් තිස්සේ අපි ඇතුළේ තිබුනා. සති අන්තයක, එහෙම නැත්නම් කුඩා චාරිකාවක දී කඳුකරයේ ගෙවූ රාත්‍රියක, මමයි අර්නෙස්ටෝයි මගේ අනික් සහෝදරයෝයි එක්ක මේව ගැන කතා කළා කෙළවරක් නැතුව. අපේ අනාගත චාරිකා-වේ මුල්ම සැලසුම් ක්‍රම ක්‍රමයෙන් හැදෙන්නට වුනා.

*1951 දෙසැම්බර් 29 දා, අර්නෙස්ටෝ ග්වාරා, ඇල්බර්ටෝ ග්‍රෙනාඩෝස් සමග මෝටර් සයිකලයේ නැගුනේ, දීර්ඝ වූ ද වෙහෙසකර වූ ද, පසු කලෙක ලෝක ප්‍රකට වූ මෝටර්-සයිකල් චාරිකාව අරඹනු පිණිසයි. තරුණ අර්නෙස්ටෝ ග්වාරා, පසුව ලෝකය හඳුනාගත් චේ ග්වාරා නම් වූ විප්ලවවාදියා බවට රූපාන්තරණය කළා වූ හැරවුම් ලක්ෂ්‍යය මේ ගමනයි. ඔවුන්ගේ මුල් සැලැසුම වූයේ පැසිෆික් වෙරළ*



*තීරයේ මුළු දුර ආවරණය කිරීමයි.*

**ඇල්බර්ටෝ ග්‍රෙනාඩෝස් [ALBERTO GRANADOS] මෙසේ කියයි:**

සංචාරය පුරාවට අපේ මෝටර් සයිකලය කිසිම ලෙඩක් නොදී දිව්වා නම් මේ චාරිකාව මේ තරම් වටිනා අගනා අත්දැකීමක් නොවෙන්න හොඳටෝම ඉඩ තිබුනා. ඒත්, එහෙම වුනේ නෑ. චිලියේ සැන්ටියාගෝවට ළං වෙන්න ඔන්න මෙන්න තියෙද්දි, සයිකලේ තවත් දුරනං යන්ඩ බෑ කියන්ඩ ගත්තා. ඒ වෙද්දි සැලසුම් කරපු දුරෙන් අටෙන් එකක්වත් අපි කවර් කරලා තිබ්බෙ නෑ. එතනදි තමා අපි දෙන්න එයාව මග අතරමං කරලා දාලා අපේ ගමන ඉදිරියටම යන්න ඕනෙ කියන දුක්බර තීරණයට ආවේ. "සයිකලයෙන් බැහීම" තමා අපේ චාරිකාවෙදි අපිට මිනිස්සු අඳුනා ගන්න ඉඩ සැලැස්සුවේ. අපි අතට අහුවෙන හැම රැකියාවක්ම කර කර, අපේ චාරිකාවේ ඉතිරි කොටස සම්පූර්ණ කරගන්න මුදල් හෙවුවා. අපි ට්‍රක් රියදුරන් විදිහට, නාට්ටාමිලා විදිහට, පිඟන් සෝදන්නො විදිහට, නාවිකයන් විදිහට කොටින්ම වෛද්‍යවරු විදිහට පවා වැඩ කෙරුවා.

මතු සම්බන්ධයි




## *හරිය කන්න ගිය රටේ - වලහා කාපි පිලි ගැටේ*

"පින්න පාත් වෙද්දී එලියට බහින්නේ ඔහෙ ඉඳ ඕක බී. මං කුරහන් රොටි හරි කරන්නං හීලට ගෝනමස් ආනමකුත් හදලා තියෙන්නේ. " කොයින් මැනිකා මම උදෙන්ම හදා දුන්න බෙලිමල් පානයත් අරගෙන එලියට බහින්න හදනකොට කීවා. ඒත් කොයින් මැනිකා දන්නවා මම කොහොඹ ගහයට බංකුවේ වාඩි වෙලා වැව දිහා බලාගෙන උනු තේ කෝප්පයක් ඔසු පැන් කෝප්පයක් තොල ගාන්න ආසයි කියලා. ඇගේ බහට අවනත වෙලා කොට්ට පිල උඩ වාඩි උනා විතරයි. වැට කඩුල්ල දිහාවෙන් ඇහෙන සද්දෙට මම නැගිට්ටා.

මී කඩන්න යන අය මටත් කතා කරනවා. ඒත් මට මී කඩන්ට යන්න කොයින් මාමා ගෙන් නම් ඉඩක් ලැබුනත් කොයින් මැනිකාගෙන් නම් ඉඩක් ලැබෙන්නෙ නැහැ. මම තරහින් වාගේ ඉන්න කොට කොයින් මාමා මෙහෙම කීවා.

"මී කඩන්ට යන්නේ නැහැ මේ ගැන දන්නවානම්
හරිය කන්න ගිය රටේ
වලහා කාපි පිලි ගැටේ"

"මොකද මාමා එහෙම කියන්නෙ?"

"මහතැන් (මහත්තයා) වලහට මීයක් අහු උනාම ඒක බිඳලා වද අරන් එක එක උගේ පස්සෙන් තියෙනවා. ඌ පස්ස බලන්නේ අන්තිම එකත් ගත්තට පස්සෙ. තන්හාකාර අපේ උන් වළහට පිටිපස්සෙන් ඉඳලා වද ටික ගන්නවා. ටිකක් අරගෙන යන්නෙ නැතුව සේරම ගන්ට බලාන ඉඳලා වලහා ආපසු හැරෙනකම් දන්නෙ නැහැ. දුවන්න ආපහු හැරෙනකොට වලහට අහුවෙන්නේ මිනිහගෙ තට්ටම් දෙක. ඌ කනවා තට්ටම් දෙක. එකක් දෙකක් අරගෙන අයින් උනා නම් එහෙම වෙන්නෑනෙව." කොයින් මාමා කියන්නෙ කොක් හඬ දී සිනාසෙමින්.

මේ කතාව නම් අදටත් ගැලපෙනවා. අපේ ඇත්තන්ට ගන්න ගියාම සිහියක් නැහැ. එක සැරයක් දෙසරයක් අරගෙන අයින් වෙන්නෙ නැතුව සේරම ගන්ට බදා ගන්ට දඟලනවා. අන්තිමට වෙන්නේ වලහා කඩන මී වද ගන්ට ගිය එකාට වෙච්ච දේ.

කොයින් මාමාගේ කතාව ලියපු මට හිතුනා.

බෝගල

25 වන පිටෙන්

මම දැන් ඔබට කියමි.

වැඩක පලක් නැති වේලාවට සිංහල (ටෙලිඩ්‍රාමා එකක්) ටෙලි නලුවක් (ටෙලි ඩහමක්) බැලීම අපේ මාය්යාගේ සිරිතයි. දැන් ඇය බලන්නේ "වහින්න මුතු වැස්සක්" ටෙලිනලුවයි. එතැන්නි එහා මෙහා යන විට මගේ ඇස ද ටෙලිවිසනයට යොමු වේ. ඇතැම් විට මඳක් නැවතී ඒ දෙස බලා සිටීම සිදු වන්නේ මා නොදැනුවත් ව ම ය. ටෙලි නලුව (ප්ලේ වෙන) 'ලෙපෙන' අතරම පාත තීරුවක (ඇඩ්වටීස්මනට් එකක්) 'ඇඩ්මනක්' දැක්වීම වෙළඳ උපායකි. ඉන් එකක 'ජපානයේ නිශ්පාධිත විවිධ මාදිලියේ රථවාහන' ගැනද සඳහන් විය. තවත් 'ඇඩ්මනක' 'කෝකිවරියන්' ගැනත් 'තනකොළ' ගැනත් සඳහන් විය. මගේ සිතට ආවේ "අනේ කාලේ - වනේ වාසේ" යන කියමයි. අරුම පුදුම යමක් ඇසි දුටු විට කියවෙන් මේ 'වැකිත්තේ' (දියන්ත - කඩිත්ත - සිඟිත්ත මෙනි) අදහස නම් 'බොහෝ කාලයක් තිස්සේ වාසය කරන්නේ කැලේ ය' යනුයි. එය මෙසේ භාවිතා වන්නේ කවර හෙයින් දැයි මම නොදනිමි.

ඈත / දුර යන තේරුම ඇති "ග්‍රීක් " වචනයක් වු " ටෙල් " ත් 'සකු' වචනයක් වු 'නාට්‍ය' ත් එකතු කොට මුල් ම 'ටෙලිනාට්‍ය' හැදු එකා මොකා දැයි මට නිනව්වක් නැත. බෝඩ් ලෑල්ල - ලේක් හවිස් මන්දිරට - හයිඩ් පාක් පිට්ටනිය, දලදා මන්දිරය - අට මස්තානය අසා දැක ඇති ඔබට එය අරුමයක් නූනත් නිවැරදි බස් වහරට එහි ඇදයක් පෙනේ. කෙසේ වෙතත් ඒ වචනය " කුක්වරියන්" නොවී "කෝකිවරියන්" වීම ගැන සතුටු විය යුතුය. ඒ අනුව නම් (කෝකියන්) කෝකිවරයන් / වරියන්, දෙස්තරවරුන් / වරියන්, නඃස් (නර්ස්) වරයන් /වරියන්, පේශන්ට් - ඇටන්ඩන්ට් වරයන් / වරියන් වැනි වචන වල ඇදයක් ඇතැයි කියන්නේ කෙසේද?

'තණ කොළ - තන කොල - තණ කොල - තනකොළ යන හතර විදියට ම ලියැවෙන අතර ඒවා නිවරද ලෙස පිලිගැනෙන රටේ මා එය ලියන්නේ 'තනකොල' යනුවෙනි. කලද සිට මගේ යතුරු පුවරුවේ "ණ/ළ/ෂ" යතුරු ඇනහිට ඇති බව ඔබ දනිති.

"කොහිළවල - කළමනාකරු යන වචනවල දන්තජ මූර්දජ මාරු වී ඇති බව නොදකින, නොතකන අපි, උඈහිඃශ (වෙනස් ඩේ්‍ඔඈඩඈහිධහ (ස්ටීවන්සන්) වැනි වචන දකින විට කොක් හඬ ලමින් සිනාසෙමු. කොහ අල = කොහුල කොහිල වේ. වළ යනු ප හත් බිමයි. ආවාට යන්නෙන් 'වළ' බිඳී ඇතැයි සිතේ. කියන විදියට ලියන - ලියාපු විදියට කියවන සිංහල බාසාවේ න/ණ , ල/ළ, දෙකේ වෙනස දනිතත් මට න-ල දෙක කියවෙන්නේ ඉතා කලාතුරකිනි. කොතරම් වෑයම් කලත් ෂ/ශ දෙක නම් දෙ විදියකට කියන්නට මට බැරිය. ණ/ල/ෂ හඬ නඟමින් මා න /ල / ශ ලියන්නේ පහසුව සඳහාය.

කාමරයක් කුලියට දීමට

ලේලෝ - Lalor

**නිවසින් වෙන්ව පිහිටි, බාහිරින් ඇතුල් විය හැකි, නාන කාමරය සහිත සියලු පහසුකම් ඇති කාමරයක් (Granny Flat) කුලියට දීමට තිබේ**

**බිල් සමග සතියකට ඩොලර් 130 කි**

**විමසන්න**

**ඇන්ටන් - 0432 062 425**